# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1982 අංක 9 දරන ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය පනත

---

[සහතිකය සටහන් කළේ 1982 මාර්තු මස 11 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1982 මාර්තු මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : ශත 90 යි

තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1982 අංක 9 දරන ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය පනත

[සහතිකය සටහන් කළේ 1982 මාර්තු මස 11 වන දින]

එල්. ඩී.—ඕ. 87/80

**ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය පිහිටුවීම සඳහා ද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.**

1. මේ පනත 1982 අංක 9 දරන ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය.

## I වන කොටස

## ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ සංස්ථාපනය, අරමුණු, බලතල හා කර්තව්‍ය

**ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය පිහිටුවීම.**

2. (1) (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) "ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය" යනුවෙන් නම් කරනු ලබන ආයතනයක් පිහිටුවනු ලැබිය යුතු අතර, 6 වන වගන්තිය යටතේ ඒ ඒ කාලයෙහි ආයතනයෙහි සාමාජිකයන් වන්නා වූ තැනැත්තන්ගෙන් එය සමන්විත විය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙන් එයට පවරා ඇති නාමයෙන් ආයතනය සංස්ථාගත මණ්ඩලයක් විය යුතු අතර, එයට අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ද තිබිය යුතු ය ; තව ද එහි සංස්ථාගත නාමයෙන් එය විසින් හා එයට විරුද්ධව නඩු පවරනු ලැබිය හැකි ය.

(3) පාලක මණ්ඩලයේ සාමාජිකයන් ආයතනයෙහි සාමාජිකයන් විය යුතු ය.

ආයතනයේ පොදු අරමුණු.

3. (1) ආයතනයේ පොදු අරමුණු—

(අ) රාජ්‍ය නිලධරයන්ගේ නිල කාර්ය ඵලදායී ලෙස ඉටු කිරීමට අවශ්‍ය වන අවබෝධය, කෞශල්‍යය හා හැසිරීම පුහුණුව මගින් වර්ධනය කිරීම ;

(ආ) කළමනාකරණ හා රාජ්‍ය පරිපාලන ක්ෂේත්‍රයන්හි පුහුණු කිරීමේ පාඨමාලා සංවිධානය කිරීම ;

(ඇ) ආයතනය මගින් පවත්වනු ලබන පුහුණු කිරීමේ පාඨමාලා වලට සම්බන්ධ සහතික පත්‍ර හා ඩිප්ලෝමා ප්‍රදානය කිරීම ;

(ඈ) සෑම මට්ටමක ම කාර්යක්ෂම හා ඵලදායී පරිපාලනය සහතික කිරීම පිණිස රාජ්‍ය සේවය මුළුල්ලේ අධීක්ෂණය හා ආධාර කාර්ය මණ්ඩල ප්‍රවීණ සේවක සංඛ්‍යාවක් වර්ධනය කිරීම ;

61132—13,775 (82/01)

(ඉ) කළමනාකරණය පිළිබඳ විවිධ කර්තව්‍ය ක්ෂේත්‍රයන්හි උපදෙස් ලබා ගැනීම, අදහස් විමසීම හා විශේෂ පැවරීම් සඳහා විශේෂඥයන්ගේ සේවාවන් ආණ්ඩුවට හා රටට ලබා ගැනීමට සැලැස්වීම;

(ඊ) රාජ්‍ය අංශයේ අනුයෝජිත ආයතනවලට ඒවායේ සංවිධානාත්මක කළමනාකරණ ක්‍රම නැවත සලකා බැලීමට හා වැඩිදියුණු කිරීමට සහාය වීම;

(උ) උපදේශක කාර්ය භාරය භාර ගැනීම;

(ඌ) කළමනාකරණය හා සංවිධානාත්මක න්‍යායයන් හා පරිචයන් සහ රාජ්‍ය පරිපාලන ක්‍රම පිළිබඳව විවේචනාත්මකව තක්සේරු කිරීම හා සුදුසු වෙනස්කම් කිරීම සඳහා මණ්ඩලයක් ඇති කිරීම;

(එ) කළමනාකරණ සංවර්ධනය, ආයතන කටයුතු, ප්‍රතිමාන, වින්දි ගෙවීමේ ක්‍රම නිශ්චය කිරීම ආදිය සම්බන්ධයෙන් රාජ්‍ය අංශයේ සංවිධානවලට සහාය දීම සහ සාමාන්‍යයෙන් ඒවායේ පලදාව වැඩිදියුණු කිරීම;

(ඒ) ශ්‍රී ලංකාවේ හා විදේශවල කළමනාකරණ පුහුණු කිරීම, පර්යේෂණ පැවැත්වීම හා ඊට සම්බන්ධ කටයුතුවල දී අන්‍ය සංවිධානයන්, සමූහයන් සහ පුද්ගලයන් සමග උද්යෝගීව සහයෝගයෙන් කටයුතු කිරීම;

(ඔ) සුදුසු ජාතික හා ජාත්‍යන්තර මණ්ඩල හා සම්මේලන ඉදිරියේ ආයතනය නියෝජනය කිරීම;

(ඕ) අවශ්‍ය අවස්ථාවල අනුමත කරන ලද ජාතික හෝ ජාත්‍යන්තර සංවිධානවල සහාය ඇතිව කළමනාකරණය හා රාජ්‍ය පරිපාලනය සම්බන්ධයෙන් සාකච්ඡා හා සම්මන්ත්‍රණ සංවිධානය කර පැවැත්වීම හා ඒ සම්බන්ධ පොත් පත්, සඟරා පළ කිරීම;

(ක) ආයතනයේ කර්තව්‍ය හා කටයුතු පිළිබඳ තොරතුරු මහජනතාව හා අදාළ ආයතන අතර පතුරුවා හැරීම

විය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් යම් කරුණක් හෝ සියලුම කරුණු සහ අමාත්‍යවරයා විසින් උපදෙස් සඳහා ආයතනය වෙත යොමු කරනු ලබන වෙනත් යම් කරුණක් සම්බන්ධයෙන් ඒ පිළිබඳව අමාත්‍යවරයාට උපදෙස් දීම ආයතනයේ කාර්යය විය යුතු ය.

ආයතනයේ බලතල.

4. ස්වකීය අරමුණු හා කාර්ය ක්‍රියාත්මක කිරීම සඳහා සහ විශේෂයෙන් —

(අ) යම් චංචල හෝ නිශ්චල දේපළක් යම් ආකාරයකින් අත්කර ගැනීම හා ලබා ගැනීම, බද්දක් හෝ කුලියක් මත ගැනීම හෝ දීම හෝ උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම;

(ආ) කළමනාකරණ පුහුණු කිරීම් හා අධ්‍යාපන මධ්‍යස්ථාන පිහිටුවා ක්‍රියාත්මක කිරීම ;

(ඇ) කළමනාකරණයෙහි සියලු අංශ පිළිබඳව පර්යේෂණ පැවැත්වීමත්, එවැනි පර්යේෂණ පැවැත්වීම සම්බන්ධීකරණය කිරීම, දිරි ගැන්වීම සහ ඒවාට ආධාර කිරීම ;

(ඈ) ආයතනයේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයෙහි නියුක්ත කිරීම, පාරිශ්‍රමික ගෙවීම සහ ඔවුන්ගේ විනය පාලනය කිරීම ;

(ඉ) ආයතනය විසින් කරනු ලැබූ යම් සේවා සඳහා ගාස්තු හෝ අයකිරීම් නියම කිරීම ;

(ඊ) ආයතනයට කරනු ලැබූ යම් සේවා සඳහා ගාස්තු හෝ අය කිරීම් ගෙවීම ;

(උ) ආයතනයේ කාර්යය සඳහා අවශ්‍ය පිරියත යන්ත්‍ර සහ උපකරණ ආනයනය කිරීම සහ ආයතනයේ අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා උපකරණ, අරමුදල්, සේවා මණ්ඩල සහ යම් වෙනත් ආධාර භාර ගැනීම ;

(ඌ) ආයතනයේ සේවා මණ්ඩලය සඳහා වැඩ ඉටු කිරීමේ ප්‍රමිතයන් ඇති කිරීම, ඒ වැඩ ඉටු කිරීම අගැයීම සහ ඒ පිළිබඳව යුක්ති සහගත ක්‍රියාමාර්ග ගැනීම ;

(එ) ආයතනයේ සේවා නියුක්තයන් සඳහා සුභ සාධක සහ විනෝදාස්වාද පහසුකම් සැලසීම සහ පවත්වාගෙන යාම ;

(ඒ) පත් කිරීම, පුහුණු කිරීම, උසස් කිරීම, පාරිශ්‍රමික ගෙවීම, විනය පාලනය කිරීම, කල්ක්‍රියාව සහ නිවාඩු ප්‍රදානය ඇතුළුව ආයතනයේ නිලධරයන් හා සේවකයන් සම්බන්ධයෙන් රීති සෑදීම ;

(ඔ) ආයතනයේ සාමාන්‍ය පරිපාලනය සම්බන්ධයෙන් රීති සෑදීම ;

(ඕ) ආයතනයේ අරමුණු සහ කර්තව්‍ය මුදුන්පත් කර ගැනීමට අවශ්‍ය වන හෝ උපකාරී වන හෝ ආනුෂංගික වන වෙනත් සියලු දේ කිරීම

සඳහා යුක්ති සහගත ලෙස අවශ්‍ය වන්නා වූ බලතල, අයිතිවාසිකම් සහ කර්තව්‍ය ආයතනයට තිබිය යුතු ය.

5. ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ ස්වකීය අරමුණු ඉටු කර ගැනීමේ දී ආයතනය විසින් ආණ්ඩුවේ ප්‍රතිපත්තිය සහ ඒ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලැබූ යම් සාමාන්‍ය හෝ විශේෂ විධාන අනුව කටයුතු කළ යුතු ය. අමාත්‍යවරයාගේ විධාන යටතේ ආයතනය විසින් ස්වකීය බලතල ක්‍රියාත්මක කළ යුතු බව.

පාලක සභාවේ සංයුතිය.

6. (1) අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබූ පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත වන්නා වූ (මෙහි මින් මතු "පාලක සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) පාලක සභාවක් ආයතනය යට තිබිය යුතු ය, එනම්—

(අ) තත්කාලයෙහි රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් ධුරය දරන තැනැත්තා වන්නා වූ සභාපතිවරයකු ;

(ආ) තත්කාලයෙහි අග්‍රාමාත්‍යවරයාගේ ලේකම් ධුරය දරන තැනැත්තා ;

(ඇ) තත්කාලයෙහි මුදල් හා ක්‍රම සම්පාදන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් ධුරය දරන තැනැත්තා ;

(ඈ) තත් කාලයෙහි සැලසුම් ක්‍රියාත්මක කිරීමේ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් ධුරය දරන තැනැත්තා ;

(ඉ) තත්කාලයෙහි උසස් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් ධුරය දරන තැනැත්තා ;

(ඊ) තත්කාලයෙහි ස්වදේශ කටයුතු විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් ධුරය දරන තැනැත්තා ;

(උ) අමාත්‍යවරයාගේ මතය අනුව පෞද්ගලික අංශයෙහි කළමනාකරණය පිළිබඳ විශිෂ්ටත්වයක් කරනු ලබන තැනැත්තකු ;

(ඌ) තත්කාලයෙහි ආයතනයේ අධ්‍යක්ෂ ධුරය දරන්නා වූ ද පාලක සභාව කැඳවන්නා ලෙස ක්‍රියා කළ යුතු වූ ද තැනැත්තා.

(2) (අ) යම් තැනැත්තෙක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් නම් හෝ මන්ත්‍රීවරයකු වුවහොත් ; හෝ

(ආ) යම් තැනැත්තෙක් ආයතනය විසින් හෝ ඒ වෙනුවෙන් එළඹෙන ලද යම් ගිවිසුමක් යටතේ යම් අයිතිවාසිකමක් හෝ ප්‍රතිලාභයක් කෙලින් ම හෝ අන් අයුරකින් ලබන්නේ නම් හෝ භුක්ති විඳින්නේ නම් ; හෝ

(ඇ) යම් තැනැත්තකුට පාලක සභාවේ සාමාජිකයකු වශයෙන් තම කර්තව්‍ය තමා විසින් ඉටු කිරීමේ දී ඊට හානිකර අන්දමින් බලපෑමට ඉඩ ඇති යම් මූල්‍ය හෝ වෙනත් සම්බන්ධතාවක් ඇත්නම්

ඔහු පාලක සභාවේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ එසේ දිගට ම කටයුතු කරගෙන යාමට හෝ සුදුස්සෙක් නොවන්නේ ය.

*පාලක සභාවේ සාමාජිකයන්ගේ ධුර කාලය.*

7. (1) 6 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ සෑම සාමාජිකයකු ම, මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් කලින් තම ධුරය හිස් කළහොත් මිස අවුරුදු තුනක කාලයක් තුළ ධුරය දැරිය යුතු ය.

(2) (අ) 6 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ පාලක සභාවේ සාමාජිකයකු මිය ගිය හෝ ඉල්ලා අස් වූ හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබූ හෝ අවස්ථාවක, අමාත්‍යවරයා විසින් ඒ වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගෙන මිය ගිය, ඉල්ලා අස් වූ හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබූ සාමාජිකයා වෙනුවට වෙනත් තැනැත්තකු සාමාජිකයකු ලෙස පත් කරනු ලැබිය හැකි ය.

(ආ) මේ උපවගන්තියේ (අ) ඡේදය යටතේ පත් කරනු ලැබූ පාලක සභාවේ යම් සාමාජිකයකු කලින් ඉල්ලා අස්වුවහොත් හෝ මරණය හෝ ඉවත් කිරීම නිසා හෝ තම ධුරය හිස් කරනු ලැබුවහොත් හෝ මිස තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාලය තුළ ඔහු ධුරය දරන්නේ ය.

(3) 6 වන වගන්තියේ (උ) ඡේදය යටතේ පත් කරනු ලැබූ පාලක සභාවෙහි සාමාජිකයකු රෝගාතුරවීම නිසා හෝ වෙනත් අබලතාවක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ තම ධුරයෙහි කටයුතු කිරීම තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, අමාත්‍යවරයා විසින් ඒ ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගෙන ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීමට යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

*පාලක සභාවේ සාමාජිකයකු ධුරයෙන් ඉවත් කිරීමට අමාත්‍යවරයාගේ බලය.*

8. (1) 6 වන හෝ 7 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ පාලක සභාවේ යම් සාමාජිකයකු ඉවත් කිරීම අවස්ථාවෝචිත යයි අමාත්‍යවරයා විසින් සලකනු ලබන්නේ නම්, හේතු නොදක්වා වුවද එසේ ඉවත් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් සාමාජිකයකු ඉවත් කරනු ලැබීම කිසිම අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

*පාලක සභාවේ සාමාජිකයන්ගේ ඉල්ලා අස්වීම.*

9. පාලක සභාවේ සාමාජිකයකුට අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියකින් ඕනෑම අවස්ථාවක ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

*පාලක සභාවේ සාමාජිකයකු වශයෙන් නැවත පත් කිරීමට සුදුසුකම්.*

10. 8 වන වගන්තිය යටතේ ධුරයෙන් අස් කරනු ලබන සාමාජිකයකු හැර සිය ධුරය අත් හරිනු ලබන යම් සාමාජිකයකු නැවත පත් කිරීමට සුදුස්සකු විය යුතු ය.

*යම් ඇබෑර්තුවක හෝ සාමාජිකයකු පත් කිරීමේ දෝෂයක් හේතුවෙන් ආයතනයේ ක්‍රියා හෝ කාර්ය පටිපාටි අවලංගු ලෙස සලකනු නොලැබිය යුතු බව.*

11. ආයතනයේ කිසිම ක්‍රියාවක් හෝ කාර්ය පටිපාටියක් පාලක සභාවේ යම් ඇබෑර්තුවක් පැවතීමේ හෝ මණ්ඩලයේ යම් සාමාජිකයකු පත් කිරීමේ දෝෂයක හෝ හේතුවෙන් අවලංගු ලෙස සලකනු නොලැබිය යුතු ය.

සාමාජිකයන්ගේ පාරිශ්‍රමික.

**12.** මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි පාරිශ්‍රමික ආයතනයේ අරමුදල්වලින් පාලක සභාවේ සියලුම සාමාජිකයන්ට හෝ යම් සාමාජිකයකුට හෝ ගෙවනු ලැබිය හැකි ය.

පාලක සභාවේ රැස්වීම්

**13.** (1) පාලක සභාවේ රැස්වීම් සෑම මාසයකට ම යටත් පිරිසෙයින් එක් වරක්වත් පවත්වනු ලැබිය යුතු ය.

(2) සභාපතිවරයා විසින් එක් එක් සාමාජිකයාට පාලක සභාවේ සෑම රැස්වීමක් පිළිබඳව යටත් පිරිසෙයින් දින හතක ලිඛිත දැනුම් දීමක් දිය යුතු අතර, ඒ රැස්වීමේ දී කරනු ලබන කටයුතු ඒ දැන්වීමෙහි සඳහන් කළ යුතු ය.

(3) පාලක සභාවේ සාමාජිකයන් දෙදෙනකු විසින් ලිඛිතව කරනු ලබන ඉල්ලීමකින් පසුව දින හතක් ඇතුළත සභාපතිවරයා විසින් (2) වන උපවගන්තියේ විධිවිධාන නොතකා විශේෂ රැස්වීමක් කැඳවනු ලැබිය යුතු ය.

(4) පාලක සභාවේ ඕනෑම රැස්වීමක ගණපූරණය සඳහා සාමාජිකයන් පස් දෙනකු සිටිය යුතු ය.

(5) සභාපතිවරයා පාලක සභාවේ රැස්වීම්වල මූලසුන දැරිය යුතු අතර පාලක සභාවේ යම් රැස්වීමකට සභාපතිවරයා නොපැමිණි විට, පැමිණ සිටින සාමාජිකයන්ගෙන් බහුතරය විසින් තෝරාගනු ලබන සාමාජිකයකු ඒ සභාවේ මූලසුන දැරිය යුතු ය.

(6) රෝගාතුරවීම නිසා හෝ වෙනත් අබලතාවක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ ස්වකීය ධුරයෙහි කාර්ය ඉටු කිරීමට සභාපතිවරයාට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක අමාත්‍යවරයා විසින් ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීමට සාමාජිකයන්ගෙන් වෙනත් අයකු පත් කරනු ලැබිය හැකි ය.

(7) පාලක සභාවේ රැස්වීමක දී තීරණය කරන ලද යම් කරුණක් හෝ දෙයක් හෝ පිළිබඳව ඡන්ද සංඛ්‍යාවල සමානත්වයක් පවතින අවස්ථාවක, සභාපතිවරයාට ඒ රැස්වීමේ දී ස්වකීය ඡන්දයට අතිරේකව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(8) මෙහි ඇතුළත් විධිවිධානවලට යටත්ව පාලක සභාව විසින් ස්වකීය කාර්ය පරිපාටිය නිශ්චය කරනු ලැබිය හැකි ය.

## II වන කොටස

### ආයතනයේ අධ්‍යක්ෂවරයා සහ වෙනත් නිලධරයන් හා සේවකයන් පත් කිරීම

ආයතනයේ අධ්‍යක්ෂවරයා පත් කිරීම.

**14.** (1) අමාත්‍යවරයා විසින් ආයතනයේ කාර්ය මණ්ඩලයට (මෙහි මින් මතු " අධ්‍යක්ෂවරයා " යනුවෙන් සඳහන් කරනු ලබන) ආයතනයේ අධ්‍යක්ෂවරයකු පත් කරනු ලැබිය හැකි අතර ඔහු එහි ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය.

(2) අධ්‍යක්ෂවරයා විසින් ඔහු වෙත පවරනු ලැබිය හැකි බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ අධ්‍යක්ෂවරයා අමාත්‍යවරයා විසින් ධුරයෙන් ඉවත් කළ හැකි අතර, එසේ ඉවත් කිරීම කිසිදු අධිකරණයක දී ප්‍රශ්න කරනු නො ලැබිය යුතු ය.

(4) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි පාරිශ්‍රමික අධ්‍යක්ෂවරයාට ගෙවනු ලැබිය හැකි ය.

**15.** (1) මේ පනතේ වෙනත් විධිවිධානයන්ට යටත්ව— ආයතනයේ කාර්ය මණ්ඩලයට පත් කිරීම සම්බන්ධයෙන් ආයතනය සතු බලතල.

(අ) ආයතනයේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි වෙනත් නිලධරයන් හා සේවකයන් ආයතනයේ කාර්ය මණ්ඩලයට පත් කිරීම ;

(ආ) ආයතනයේ කාර්ය මණ්ඩලය පිළිබඳ විනය පාලනය කිරීම සහ ඔවුන් පහ කිරීම ;

(ඇ) කාර්ය මණ්ඩලයේ වේතන හෝ වැටුප් හෝ වෙනත් පාරිශ්‍රමික නියම කිරීම ;

(ඈ) ඒ කාර්ය මණ්ඩලයේ සේවා නියම සහ කොන්දේසි නිශ්චය කිරීම ; සහ

(ඉ) ඒ කාර්ය මණ්ඩලයේ යහපත සඳහා අර්ථසාධක අරමුදල් සහ යෝජනා ක්‍රම පිහිටුවීම හා විධිමත් කිරීම හා එවැනි යම් අරමුදලකට හෝ යෝජනා ක්‍රමයකට දායක මුදල් ගෙවීම

පාලක සභාව විසින් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් සියලු කාරණා හෝ ඉන් යම් කාරණයක් සම්බන්ධයෙන් රීති මේ පනත යටතේ සාදනු ලැබිය හැකි ය.

**16.** (1) පාලක සභාව විසින් ආයතනයේ කාර්ය මණ්ඩලයට වෙනත් නිලධරයන් හෝ සේවකයන් පත් කිරීම සම්බන්ධයෙන් එය සතු සියලු හෝ යම් බලතල අධ්‍යක්ෂවරයා වෙත පවරනු ලැබිය හැකි ය. අධ්‍යක්ෂවරයා විසින් ඔහු වෙත පවරන ලද බලතල යටතේ පත් කරනු ලැබූ වෘත්තීය කාර්ය මණ්ඩලයේ කිසියම් සාමාජිකයකුගේ පාරිශ්‍රමික ඇතුළුව සේවා නියුක්ත කොන්දේසි පාලක සභාවේ එකඟත්වය ඇතිව ඔහු විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය. පත් කිරීම සම්බන්ධයෙන් පාලක සභාවේ අධ්‍යක්ෂවරයාට බලතල පැවරීම

(2) මේ වගන්තිය යටතේ අධ්‍යක්ෂවරයා විසින් ගන්නා ලද යම් තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් ඒ තීරණයට විරුද්ධව ලිඛිතව පාලක සභාවට අභියාචනය කළ හැකි අතර, ඒ අභියාචනය පිළිබඳ පාලක සභාවේ තීරණය අවසානාත්මක විය යුතු ය.

(3) අධ්‍යක්ෂවරයා විසින් ආයතනයේ වෘත්තීය කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයකු පහ කරනු ලැබීම පාලක සභාව විසින් අනුමත කරන ලද්දේ නම් මිස එය බලාත්මක නොවිය යුතු ය.

**17.** අධ්‍යක්ෂවරයා විසින් ආයතනයේ නිලධරයන්ගේ හා සේවකයන්ගේ කාර්ය නිශ්චය කරනු ලැබිය යුතු ය. කාර්ය නිශ්චය කිරීම.

ආයතනයේ කාර්ය මණ්ඩලයට රජයේ නිලධරයන් පත් කිරීම.

18. (1) රජයේ සේවයේ යම් නිලධරයකු පාලක සභාවේ ඉල්ලීම පිට සහ ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ එවැනිම කැමැත්ත ඇතිව ආයතනය විසින් නිශ්චය කරනු ලබන කාල සීමාවකට ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකිය; නැත හොත් එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) රජයේ සේවයේ යම් නිලධරයකු ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනා ගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහුට හා ඔහු සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

(3) රජයේ සේවයේ යම් නිලධරයකු ආයතනයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනා ගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (3) වන උපවගන්තියෙහි විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහුට හා ඔහු සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

(4) රාජ්‍ය සංස්ථාවක යම් නිලධරයකු හෝ සේවකයකු ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ ද ඒ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ද කැමැත්ත ඇතිව, අර්ථසාධක අරමුදල් හිමිකම් පිළිබඳ නියම හා කොන්දේසි ඇතුළුව, ඒ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ පාලක සභාවේ සාමාජිකයන් එකඟ වන නියම හා කොන්දේසි මත ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව හෝ ස්ථිරව හෝ පත් කරනු ලැබිය හැකි ය.

(5) නියමිත කාලසීමාවක් සඳහා ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වී ආණ්ඩුව සමග ගිවිසුමකට එළඹුණු යම් තැනැත්තකු ආයතනය විසින් සේවයේ යොදවනු ලැබූ අවස්ථාවක ඒ තැනැත්තා විසින් ආයතනයට සේවය කරනු ලබන යම් සේවා කාලයක් වේ නම් එය යට කී ගිවිසුමේ බැඳීම් ඉටුකිරීමෙහි කාර්ය සඳහා ඔහු විසින් ආණ්ඩුවට කරනු ලබන සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

## III වන කොටස

### මුදල්

ආයතනයේ අරමුදල.

19. (1) ආයතනයට ආයතනයේ ම අරමුදලක් තිබිය යුතු ය.

(2) ආයතනයේ අරමුදලට—

(අ) ආයතනයේ පරිහරණය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලබන සියලු මුදල් ප්‍රමාණ; සහ

(ආ) ආයතනයේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී, කර්තව්‍ය හා කාර්ය ඉටු කිරීමේ දී ආයතනය වෙත ලැබෙන සියලුම මුදල් ප්‍රමාණයන්

බැර කරනු ලැබිය යුතු ය.

(3) ආයතනයේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී, කර්තව්‍ය හා කාර්ය ඉටුකිරීමේ දී ආයතනය විසින් දරන ලද යම් වියදම් ගෙවීමට අවශ්‍ය වන සියලු මුදල් ප්‍රමාණයන්, අරමුදලට වැය බරක් කරනු ලැබිය යුතු ය.

20. ආයතනයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය. ආයතනයේ මුදල් වර්ෂය.

21. ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවෙහි විධිවිධාන ආයතනයේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් ද අදාළ විය යුතු ය. ගිණුම් විගණනය කිරීම.

## IV වන කොටස

### සාමාන්‍ය

22. දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා ආයතනයේ සියලු සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් රජයේ සේවකයන් සේ සලකනු ලැබිය යුතු ය. ආයතනයේ සාමාජිකයින් සහ සේවා නියුක්තයන් රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු බව.

23. ආයතනය, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය. අල්ලස් පනතේ අර්ථානුකූලව ආයතනය උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු බව.

24. (1) ආයතනයේ සෑම සාමාජිකයකු ම, නිලධරයකු ම හෝ සේවකයකු ම ස්වකීය කාර්ය හෝ කර්තව්‍ය ඉටුකිරීමේ කාර්ය සඳහා හෝ අමාත්‍යවරයාට හෝ අධිකරණයක් ඉදිරියේ හෝ යම් නීතියක් යටතේ හෝ හෙළිදරව් කරන ලෙස නියම කරනු ලැබූ අවස්ථාවක හෝ හැර ස්වකීය කාර්ය හෝ කර්තව්‍ය ඉටුකිරීමේ දී ඔහු විසින් ලබා ගන්නා ලද කිසියම් තොරතුරක් යම් තැනැත්තකුට ඔහු විසින් හෙළිදරව් නොකළ යුතු ය : රහස්‍යභාවය.

එසේ වුව ද ආණ්ඩුව හැර වෙනත් පාර්ශ්වයක් සමග වූ යම් ගිවිසුමක් රහස්‍ය ලෙස සැලකීමට ආයතනය බැඳී ඇති කරුණුවලට අදාළ කිසිම තොරතුරක් මේ වගන්තියේ පෙරාතුව වූ විධිවිධාන යටතේ හෙළිදරව් නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන කඩකරන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු ය.

25. (1) ආයතනය වෙනුවෙන් පහත දැක්වෙන පරිදි ගිවිසුම් ඇති කර ගත හැකි ය :— ගිවිසුම්.

(අ) පෞද්ගලික තැනැත්තන් අතර ඇති කර ගන්නා ලද්දා වූ ද නීතිය අනුව ලියවිල්ලකින් විය යුතු වූ ද ගිවිසුමක් නම්, එය ආයතනය වෙනුවෙන්, ආයතනයේ පොදු මුද්‍රාව යටතේ

(ආ) පෞද්ගලික තැනැත්තන් අතර ඇති කර ගන්නා ලද්දු වූ ද නීතිය අනුව ලියවිල්ලකින් විය යුතු වූ ද එහි පාර්ශ්ව කරුවන් විසින් අත්සන් කරනු ලැබිය යුතු වූ ද ගිවිසුමක් නම්, එය ආයතනය වෙනුවෙන්, තත් කාර්යය සඳහා විධිමත්ව බලය පවරනු ලැබූ යම් තැනැත්තකු විසින් හෝ යම් තැනැත්තන් විසින් හෝ අත්සන් කොට ලියවිල්ල කින් ඇති කර ගත හැකි ය;

(ඇ) පෞද්ගලික තැනැත්තන් අතර ඇති කර ගන්නා ලද්දු වූ ද ලියවිල්ලකින් නොමැතිව වාචිකව පමණක් ඇති කර ගන්නා ලද්දු වූ නමුදු නීතියෙන් වලංගු වන ගිවිසු මක් නම්, එය ආයතනය වෙනුවෙන්, තත් කාර්යය සඳහා විධිමත්ව බලය පවරනු ලැබූ යම් තැනැත්තකු විසින් හෝ තැනැත්තන් විසින් හෝ වාචිකව ඇති කර ගත හැකි ය.

(2) මේ වගන්තිය අනුව ඇති කර ගන්නා ලද ගිවිසුමක්, නීති යෙහි ලා බලාත්මක විය යුතු අතර ආයතනය ද ඒ ගිවිසුමේ වෙනත් සියලු පාර්ශ්වකරුවන් ද ඔවුන්ගේ නීත්‍යනුකූල නියෝජිතයන් ද ඉන් බැඳීමකට යටත් විය යුතු ය.

**ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ ආයතනය සඳහා නිශ්චල දේපළ අත්කර ගැනීම.**

**26.** (1) යම් නිශ්චල දේපළක් ආයතනයේ කාර්ය සඳහා අත්කර ගනු ලැබීමට අවශ්‍ය වී අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයකින් යෝජිත අත්කර ගැනීම අනුමත කරනු ලැබූ අවස්ථාවක, ඒ දේපළ පොදු කාර්යයක් සඳහා අවශ්‍ය යයි සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කරගනු ලැබ ආයතනයට පවරනු ලැබිය හැකි ය.

(2) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ යම් නිශ්චල දේපළක් ආයතනයට අත්කර ගැනීම සඳහා ගෙවිය යුතු යම් මුදල් ප්‍රමාණයක් වේ නම්, එය ආයතනයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

චංචල වූ ද නිශ්චල වූ ද දෙවර්ගයේ ම රජයේ දේපළ ආයතනයට ලබා දිය හැකි බව.

**27.** (1) රජයේ යම් නිශ්චල දේපළක් ආයතනයේ කාර්යය සඳහා අවශ්‍ය වී ඇති අවස්ථාවක, ඒ කාර්යය රජයේ ඉඩම් ආඥා පනතේ 6 වන වගන්තිය යටතෙහි ඒ දේපළ පිළිබඳ විශේෂ ප්‍රදාන යක් හෝ බදු දීමක් ආයතනය වෙත කරනු ලැබිය හැකි කාර්යයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඒ ආඥාපනතේ විධිවිධාන ඒ කාර්යය සඳහා ඒ දේපළ පිළිබඳව ආයතනයට කරනු ලැබූ විශේෂ ප්‍රදානයකට හෝ බදු දීමකට අදාළ විය යුතු ය.

(2) රජයේ යම් චංචල දේපළක් ආයතනයේ කාර්යය සඳහා අවශ්‍ය වී ඇති අවස්ථාවක, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමය කින් ඒ චංචල දේපළෙහි සන්තකය හා පරිහරණය ආයතනයට පැවරීම හා ආයතනය වෙත සතු කිරීම අමාත්‍යවරයා විසින් කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, රජයේ යම් චංචල දේපළකට බලපාන නියමයක්, ඒ දේපළ විෂයෙහි පාලනය දරන අමාත්‍යවරයාගේ එකඟත්වය නොමැති ව, මේ වගන්තියේ පෙරාතුව වූ විධිවිධාන යටතේ නොක රනු ලැබිය යුතු ය.

රජය විසින් භූමිභාග ගොඩනැගිලි ආදිය ආයතනයේ පරිහරණයට ලබා දිය හැකි බව.

28. රජය විසින් ආයතනයේ පරිහරණය සඳහා අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි ඉඩම්, ගොඩනැගිලි සහ වෙනත් පහසුකම් සපයනු ලැබිය හැකි ය.

" ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය " යන වචන පරිහරණය කිරීමේ සීමාව.

29. (1) ආයතනය හැර වෙනත් කිසිම තැනැත්තකු විසින් " ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය " යන වචන ඇතුළත් නිල නාමය යටතේ හෝ, වෙනත් යම් වචන පරිහරණය කිරීමෙන් ඒ තැනැත්තා " ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය " ආශ්‍රිතව හෝ එහි අනුමතය ඇතිව හෝ එහි අධිකාරය යටතේ හෝ කටයුත්තක්, ව්‍යාපාරයක්, වෙළෙඳාමක් හෝ ව්‍යාපෘතියක් පවත්වා ගෙන යන්නේ යයි වටහා ගත හැකි ආකාරයට හෝ යම් කටයුත්තක්, ව්‍යාපාරයක්, වෙළෙඳාමක් හෝ ව්‍යාපෘතියක් පවත්වා ගෙන යාම නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන කඩ කරන යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන්නේ ය.

ආයතනයට විශේෂ හෝ සාමාන්‍ය විධාන කිරීමට අමාත්‍යවරයා සතු බලය.

30. (1) ආයතනයේ කාර්ය ඉටු කිරීම සහ බලතල ක්‍රියාත්මක කිරීම පිළිබඳව විශේෂ හෝ සාමාන්‍ය විධාන අමාත්‍යවරයා විසින් ලියවිල්ලකින් කළ හැකි අතර ආයතනය විසින් ඒ විධාන බලාත්මක කළ යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් ආයතනයේ වැඩ කටයුතු සම්බන්ධයෙන් ඔහුට අවශ්‍ය විය හැකි තොරතුරු ලියවිල්ලකින් සපයන ලෙස ආයතනයට කලින් කල විධාන කළ හැකි ය.

රීති.

31. (1) මේ පනතින් සැදනු ලැබීමට බලය දෙනු ලැබූ හෝ අවශ්‍ය වී ඇති සියලුම කාරණා හෝ යම් කාරණාවක් සම්බන්ධයෙන් ආයතනය විසින් රීති සැදනු ලැබිය හැකි ය.

(2) ආයතනය විසින් සාදන ලද කිසිම රීතියක් එය අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන තෙක් බලාත්මක නොවිය යුතු ය.

මේ පනත යටතේ හෝ ආයතනයේ විධානය මත හෝ කරන ලද ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව.

32. (1) (අ) ආයතනය විසින් මේ පනත යටතේ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ආයතනයට විරුද්ධව, හෝ

(ආ) ආයතනයේ යම් සාමාජිකයකු, නිලධරයකු, සේවකයකු හෝ අනුයෝජිතයකු විසින් මේ පනත යටතේ හෝ පාලක සභාවේ විධානය මත සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව

කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නො ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද පරිදි එවැනි තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ පාලක සභාවේ විධානය මත හෝ කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව කවර වූ හෝ අධිකරණයක පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී දරන ලද කිසි වියදමක් වේ නම් ඒ වියදම ඔහු විසින් ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලද බවට අධිකරණය විසින් සලකනු ලබන්නේ නම් ආයතනයේ අරමුදල්වලින් ගෙවනු ලැබිය යුතු ය.

පාලක සභාවේ සාමාජිකයකුට විරුද්ධව පෞද්ගලික තත්ත්වයෙහි ලා හෝ ඔහුගේ දේපළට විරුද්ධව හෝ රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු බව.

**33.** ආයතනයට විරුද්ධව පවරන ලද යම් නඩුවක දී පාලක සභාවේ සාමාජිකයකුට විරුද්ධව පෞද්ගලික තත්ත්වයෙහි ලා හෝ ඔහුගේ දේපළට විරුද්ධව හෝ රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු ය.

වැරදි හා දණ්ඩන.

**34.** මේ පනත යටතේ වරදක් කරන සෑම තැනැත්තකුම, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි නඩු විභාගයෙන් පසුව වරදකරු කරනු ලැබූ විට, හය මාසයක් නො ඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

අර්ථ නිරූපණය.

**35.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"රාජ්‍ය සංස්ථාව" යන්නෙන්, සමාගම් ආඥාපනත යටතේ හැර වෙනත් යම්කිසි ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ හෝ පිහිටුවන ලද්දා වූ හෝ පිහිටුවනු ලබන්නා වූ ද ආණ්ඩුව විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් මුළු අරමුදල හෝ මුළු ප්‍රාග්ධනය නැතහොත් අරමුදලෙන් කොටසක් හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලබන්නා වූ ද, සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය.